සිල් ගැනීම

වරකාගොඩ ගල්ලෙන විහාරය පළාතේ දර්ශනීය, මනඳිනසුළු, මහා තේජාන්විත ස්ථානයකි. මහා ගල් පර්වතය යට තිබෙන බුදුගෙය, දේවාලය, සූවිසි විවරණය ආදී විහාරාරාංග මගේ සිත් ගත් තැන් ය. අද ගල්ලෙන විහාර පරිසර පදනම මගින් අවට පරිසරය තුළ කිසියම් වෙනස්කම් කිපයක් කර ඇතත්, ඒ සියල්ල පරිසරය සුරැකීම සඳහා කරන ලද නිර්මාණ මිස, පරිසරයේ සුන්දරත්වය නැති කර දමන කොන්ක්‍රීට් වනාන්තර වැවීමක් නොවී ම සතුටට හේතුවකි.

විහාරාධිපති ස්වාමීන්වහන්සේ ලෙස වැඩ විසූ කරන්නාගොඩ චන්ද්‍රජෝති ලොකු හාමුදුරුවන් වහන්සේද මට හොඳින් මතක ය. 2003 වසරේදී අපවත් වූ දඹර රේවත නායක ස්වාමිපාදයන් වහන්සේ මෙම විහාරස්ථානය පිරිවෙනක් බවට පත්කරමින් පන්සලේ අභිවෘද්ධිය සඳහා බොහෝ වෙහෙස මහන්සියෙන් වැඩ කටයුතු කළ ස්වාමීන් වහන්සේ නමකි. කරන්නාගොඩ මංගල ස්වාමීන් වහන්සේද එවකට කැපී පෙනෙන සේවා-වක් කළ ස්වාමීන් වහන්සේ නමකි. අද විහාරාධිපති පදවිය උසුලන පෝරුවදණ්ඩේ සුමන ස්වාමීන් වහන්සේ ද විහාරස්ථානයේ අභිවෘද්ධිය සඳහා දියත්කර ඇති වැඩ කටයුතු දෙස අපට ප්‍රබෝධමත් අපේක්ෂාවෙන් යුතුව බලා සිටිය හැක. එදා මෙදා විහාරාධිපති ධූරයෙන් පිදුම් ලැබූ බෙන්තර ශීලාතන්ද, දොඩම්ගොඩ ඉන්ද්‍රජෝති ගිම්පාණන් වහන්සේලා ඇතුළු සෑම ස්වාමීන්වහන්සේ නමකගෙන් ම කැපී පෙනෙන විශිෂ්ඨ සේවාවන් සිදුවී ඇති බව සඳහන් කරන්නේ අප්‍රමාණ භක්තියෙනි. මෙම විහාරස්ථානයේ දී ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත්වූ නාහල්ලේ චන්ද්‍රසිරි ස්වාමීන් වහන්සේ විදුහල්පතිවරයෙකු ලෙස සේවය කොට විශ්‍රාම ලබා, අඳ මද්දෙකන්ද සිරි විජිතාරාම විහාරස්ථානයේ විහාරාධිපති තනතුර දරමින් සහ නාහල්ලේ නාරද ස්වාමීන් වහන්සේ අඳ ගාල්ලේ, අතුළුගම, කහඳ ශ්‍රී සංඝරාජගුණෝදයාරාම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ ලෙස කරනු ලබන මහා මෙහෙවර පස්යොදුන් රටට ම ආඩම්බරයක් බව ගෞරවයෙන් සඳහන් කරමි. මෙම විහාරස්ථානයේ දී පැවිදි බිමට ඇතුළත් වූ නාහල්ලේ රාහුල ස්වාමීන් වහන්සේ දැනට එංගලන්තයේ ලෙස්ටර්වි බෞද්ධ මධ්‍යස්ථානයේ වැඩ වසමින් කරනු ලබන ධර්ම ප්‍රචාරක කටයුතු පිළිබඳව අපි ආඩම්බර වියයුතු වන්නෙමු. එ මෙන් ම මෙම විහාරස්ථානයේ ම පැවිදි වූ ගුරුඇළුබැද්දේ මංගල හිමි ගල්ලෙන විහාර පිරිවෙනෙහි කෘත්‍යාධිකාරී ලෙස කටයුතු කරන අතර ශාස්ත්‍රවේදී ඔක්කම්පිටියේ විජිත හිමි ත්‍රි/නාලන්දා විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස කටයුතු කරයි. මේ ආදී වශයෙන් මෙම විහාරස්ථානයෙන් අප රටට සිදුවන ආගමික සංස්කෘතික සේවාව අති මහත් ය.

අපි පුංචි සන්දියේ පන්සලට යන හැම දිනක ම මුලින් ම දුවන්නේ ''නයාගේ පොල්ගස'' බැලීමට ය. නයාගේ පොල්ගස පුංචි අපට විශේෂිත වූවකි. නයාගේ පොල්ගස යනු, විශේෂ ආකාරයකින් උසට වැඩුණු පොල්ගසකි. බිම සිට ම නයෙකුගේ ගමන් විලාසය පෙන්නුම් කරන අන්දමට ඇඳ වෙවී ගස වැඩි තිබෙන බැවින්, අපි නයෙකුගේ හැසිරවීම සිතේ මවා ගනිමින් පොල්ගස දෙස බලන්නෙමු. අද එම ගස තිබුණු ස්ථානය යටකරගත් කුඩා මනරම් වැවකි. "මෙන්න මේ හරියෙ තමයි ඒ ගහ තිබුනෙ" කියා ඇඟිල්ල දිගු කර පෙන්වනවාට වඩා නියමිත තැනක් පෙන්විය නො හැකි තරම් ය.

කරන්නාගොඩ, වරකාගොඩ, නාහල්ල ආදී අවට පළාත් වාසීන් පමණක් නොව, බොහෝ දුර බැහැර පෙදෙස් වලින් ද ජනිජනයා විශ්වාසයෙන් යුතුව භාරහාර සඳහා පැමිණෙන ශ්‍රී විෂ්ණු දේවාලය, ගල්ලෙන ඇරඹෙන ස්ථානයේ ම පිහිටා ඇත. ඉතාමත් බලසම්පන්න දේවාලයක් හැටියට සැලකෙන මෙම දේවාලය, මා පුංචි සන්දියේ සිට ම මගෙන් නැත්පත් වූ ස්ථානයකි. මට මතක නැති පුංචි සන්දියේ මා හට වැළඳුණු පැපොල් රෝගය, වෙනත් කිසිවෙකුට නො වැළඳී, මා අරක්ෂා කර සනීප කරදෙන ලෙස මෙම මහානු භාවසම්පන්න දේවාලයට පැමිණ කළ භාරය එළෙසින් ම ඉටු වී ඇති බව අදත් අම්මා සිහිපත් කරන්නේ සිතේ පවතින දැඩි භක්තියෙනි.

මෙම දේවාලයේ හාස්කම් පිළිබඳ ව ඇති විශේෂ සිද්ධියක් සඳහන් කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. වරකාගොඩ ගල්ලෙන විහාරස්ථානයේ වාර්ෂිකව පැවැත්වෙන පෙරහර ලෙන් විහාරය වටා ගමන් කිරීමට අවහිරයක්ව පැවති ගල් කොටසක් ඉවත් කිරීමේ අවශ්‍යතාවය මත ගල් බෝර දමා එම කොටස ඉවත් කළ යුතුයැ යි දායක සභාවේ තීරණය විය. එවකට විහාරාධිපති ධූරය දැරුවේ බෙන්තර ශීලාතන්ද හමි වූ ස්වාමීන් වහන්සේ නමකි. ගල් බෝර දැමීමට අදහස් කළ දිනට පෙරදින විෂ්ණු දේවාලයට පුද පූජා පවත්වා, මෙම කටයුත්ත කිසි බාධාවක්, උපද්‍රවයක් නොමැති ව හරියාකාර ව ඉටුකර ගැනීමට ඉඩ කඩ ලබා දෙන ලෙස දෙවියන්ගෙන් ඉල්ලා ඇතත් බොහෝ හැඟීම්බරව ය. බෝර දැමීමට සූදානම් ව සිටි දින පාන්දර ඉවත් කිරීමට අවශ්‍යව තිබූ ගල් කොටස ඉබේම කැඩී වෙන්වී තිබී ඇත. මහා ප්‍රසිද්ධියක් ලැබූ ජතිජනයා වැල නොකැඩී නැරඹීමට පැමිණෙන ලද මෙම සිද්ධිය සනාථ කිරීම් වස් එම කැඩි වෙන්වන ලද විශාල ගල් කොටස අද ද එම ස්ථානයේ දක්නට ඇත.

මෙම විහාරස්ථානයට සම්බන්ධ බැලම්ගල, කොඩිගල, සහ වස්තුගල ඒ පළාතේ ඇති උස් ම ස්ථාන යයි පැවසිය හැක. බැලුම්ගල මුදුනට ගිය විට හතර වටේට පෙනෙන දර්ශනය ඉතා චමත්කාර ය. ඈත පෙනෙන වෙල්යාය, පොල් ගස් මුදුන්, තයින්ගේ ගමන් විලාසය සිහිපත් කරවන මහ පාර, පන්සලේ වෛත්‍යයේ කොත් කැරැල්ල, ඈත එපිට කඳු වළල්ල ආදිය චමත්කාරයක් දනවයි. පුරාණයේ මෙම ගල් කන්ද සන්නිවේදන මධ්‍යස්ථානයක් වශයෙන් භාවිතා වුණු බවට ජනප්‍රවාද ඇත.

පුරාණයේ මේ අසල ඇති වස්තුගල නම් ගල් ගුහාවෙන් ගොවිතැන් වැඩ සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට හැකියාව තිබූ බවත්, වැඩ අවසානයේ ඒවා ආපසු ගෙන ගොස් තැබිය යුතුව තිබූ බවත් කියැවෙන මුඛ පරම්පරාගත කතාවක් ද ඇත. විහාරස්ථානයෙන් ඇරඹි උමං මාර්ගයක් පිළිබඳව මතයක් ද ඇත.

වරකාගොඩ ගල්ලෙන විහාරයට නුදුරු වරකාගොඩ හන්දියෙන් හැරී යන විට හමුවන මල්ලියකම් කරන ලද කැටයම් සහිත ගල්කණු, සඳකඩපහණ, ආදී තවමුත් සහිත ගණේදඩ නම් ස්ථානය ගැන සිතා බලන විට වැසීගිය මහා ඉතිහාස කතාවක් මේ පළාත පුරා විහිදී ඇති බව පිළිගත යුතු ව ඇත. එසේ ම මෙහි පුරාවෘත්තය ගැන සොයා බැලීම පුරා විද්‍යාවට සම්බන්ධ වගකිවයුතු ආයතන මගින් උනන්දු වන්නේ නම් එය උදාර කාර්යයක් වන බව මගේ හැඟීම යි.

වරකාගොඩ ගල්ලෙන විහාරස්ථානයේ, ඉහළ කරන්නාගොඩ සාමග්‍රී වර්ධන සමිතියේ මූලිකත්වය ඇතිව කරන ලද සූවිසි විවරණය දැක්වෙන නිර්මාණවල චමත්කාරජනක පිළිවෙළ මා වෙනත් ස්ථානයකදී මෙතුවක් දැක නැතැයි සිතමි. 1938 වර්ෂයේ ආරම්භ කොට 1946 වර්ෂයේ වැඩ අවසන්කර ඇති මෙම සූවිසි විවරණ විහාර කර්මාන්තය අවට ගම්වාසීන්ගේ ද හොඳසුරු ධන පරිත්‍යාගය සහ පිං සහල් පසුම්බි එකතු කිරීමඳී ක්‍රමෝපායන්ගෙන් කරවන ලද අතර එහි නිර්මාණ කටයුතු කරවා ඇත්තේ අමි. සාරිලිස් නම් එවකට සුප්‍රසිද්ධ චිත්‍ර හා මූර්ති ශිල්පියා ලවා ය. මෙම මහා කර්මාන්තය සඳහා වැඩ කුලිය වශයෙන් ලබාගෙන ඇත්තේ රුපියල් හාරදහස් පන්සිය පනහක මුදලක්, රුපියල් හාරසිය පනස්පහ ගණනේ දළ වනාවකදී ය. සූවිසි විවරණයේ එක් බුදුරුවක් සහ විවරණ රූපයක් අඹා හිම කිරීම සඳහා අයකොට ඇත්තේ රුපියල් තිස් පහකි. එම බුදුරුව විසිහතරම එකිනෙකට වෙනස් ව නිර්මාණය කොට ඇත. එනම් එක් අච්චුවකින් පිටපත් කර සාදා නොමැතිවිම විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ඉහළ කරන්නාගොඩ සාමග්‍රී වර්ධන සමිතියේ සභාපති ලෙස දොන් තේගිස් කන්තන්ගර අප්පුහාමි ද, ලේකම් වශයෙන් යූ. ඇල්. ඩී. ජෝන් අප්පුහාමිද, භාණ්ඩාගාරක වශයෙන් කේ. අවුනේරිස් බුත්තු අප්පුහාමිද, පරීක්ෂක වශයෙන් ඩී. ඇල්. විරක්කොඩි මුදලාලි මහතාද ගිලතල දරා ඇති අතර, විහාර සාධක කොමිටියේ ලේකම් වශයෙන් ඩී. ඇල්. ලියනගේ මහතා කටයුතු කර ඇති බව සඳහන් කරනුයේ ඔවුනට ගෞරවයක් වශයෙනි.

මන්දි දේවිය පලවැල කැඩීමට ගිය අතර ජූජක බමුණාට දරුවන් දන්දීම දැක්වෙන අඹන ලද රූප සහිත මඳ අඳුරු කොටුව හැමගේ ම සිත් ගත් දර්ශනීය තැනකි. එ තුළ ඇති පිඹුරාගේ සහ කොටියාගේ රූ දෙස අපි බලන්නේ බියමුසු වූ හැඟීමෙනි. සච්චක දමනයේ යක්ෂයා පොරවක් අමෝරා දත් විලිස්සා ගෙන සිටින පින්තූරය දෙස අප බලන්නේ හොරැහිනි. පාරිලෙය්‍ය වනයේ ඇතා බුදු රදුන්ට උක් දඬුවක් පූජා කරපු ආකාරය ද, වඳුරා මී වදයක් පූජා කිරීමේ අවස්ථාව ද, සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, නේරංජනා ගඟෙන් අසු පැන්නවීම, සිදුහත් කුමාරයා හිස මුඩු කිරීම සහ පිරිනිවන් මංචකය ඉතාමත් අලංකාර ලෙස නිර්මාණය කොට ඇත. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට බුද්ධාගම ගෙන ආ දර්ශනය පෙන්වන මිහින්තලාකන්ද පා මුලින් දුව යන මුවා අපගේ නුරතලෙකි. වෛත්‍යය සහ බෝ මළුව ළඟ ගාථා කියමින් බොහෝ වේලාවක් සිටින පිරිස් ය. ඝණ්ටාරය ගැසීමට, අප කෙතරම් ආසා තිබුණ ද, තුන් හතර පාරකට වඩා එය ගසන්නට නො ලැබෙන්නේ වැඩිහිටියෙකුගේ සැර කිරීමක් හෝ ලැබෙන ටොකු පාරක් නිසා ය.

පන්සලේ ධර්ම ශාලාව මහා විශාල ය. රජකාලයේ නිර්මාණයක් නො වුවත්, තනිකර කළුගලින් හිමවා ඇති ධර්මශාලාව මහා ගාම්භීර පෙනුමක් ගෙන එයි. තනිකර කළුගලෙන් රවුමට සාදා ඇති දැවැන්ත ගල් කණු විශ්මය දනවනසුළු ය.

මෙම පන්සලේ ඇති තවත් අපූරු වස්තුවක් ලෙස, මා දකින්නේ වී දමන පෙට්ටගම ය. අඩි අටක් දිග, අඩි පහක් පළල, අඩි පහක් පමණ උස මෙම පෙට්ටගමට අඩු ම තරමින් වී බුසල් හාර පන්සියක් දමිය හැකි යැයි අනුමාන කළ හැකි ය. අඳ ද ඉස්ටෝරු කාමරයේ ප්‍රයෝජන-යට ගන්නා එම මහා පෙට්ටගම සුවිශේෂ නිර්මාණයක් ලෙස සඳහන් කළ හැකි ය.

> මෙම පන්සලේ ඇති තවත් අපූරු වස්තුවක් ලෙස, මා දකින්නේ වී දමන පෙට්ටගම ය. අඩි අටක් දිග, අඩි පහක් පළල, අඩි පහක් පමණ උස මෙම පෙට්ටගමට අඩු ම තරමින් වී බුසල් හාර පන්සියක් දමිය හැකි යැයි අනුමාන කළ හැකි ය.

අපේ ආච්චි සෑම පසළොස්වක පෝය දිනකට ම සිල් ගන්නා හොඳ උපාසිකාවකි. අයය නොදන්නා ගාථාවක් නැති තරම් ය. ලියන්න කියන්න එතරම් ම හැකියාවක් නැති වුවත් බොහෝ ගාථා කට පාඩම් ය. ආච්චි කියා දුන් "අස්ඩි මස්මිං කායේ කේසා" යනාදී කියැවෙන පිළිකුල් භාවනාව මට අදත් කටපාඩමින් කිව හැකි ය. "බුද්ධ ඇදඟිල්ල" නම් වූ කුඩා පොත් පිංවක් ආච්චි විසින් මට ගෙනවිත් දී තිබුණි. අකුරු ගැට ගසාගෙන හෝ එය කියවමින් ගාථා පාඩම් කරන අතර, ඒවා හොඳින් ශබ්ද කිරීමට උපකාර වූයේ ආච්චිගේ දැනුම ය.

අප පුංචි දවස්වල ම ඉහළ කරන්නාගොඩ ප්‍රාථමික පාසලේ දහම් පාසලක් ආරම්භ කළා මට මතක ය. ඉරිදාට දහම් පාසල පැවැත්වූ අතර, පාසලේ ගුරු මහත්ම මහත්මීන්ට අමතරව උඩහකඩේ ඉස්කෝලේ හාමිනේ ත් සුමතිපාල මහතාත් උගැන්වූහ. සුමතිපාල මහතා යනු අපේ ආච්චිගේ ලොකු අයියා වන සුප්‍රසිද්ධ වඩු කාර්මිකයෙකු වූ තෝමස් අප්පුහාමි මහතාගේ පුත්‍රයෙකි. අපේ පන්තියට දහම් පාසලේ පුංචිම පන්තිය යි. අපේ පන්තියට උගැන්වූයේ සුමතිපාල මහතා ය. ඉතිපිසෝ ගාථාව කට පාඩමින් කියන්නට ඉගැන්නුවාට පසුව, ස්වාක්ඛාතෝ ගාථාව කියා දුන්නේ ය. එම ගාථාව කියන හැම විටකම මට අපේ ආතා මතක් වූවා මෙන් ම, ගාථාව ඉතා ඉක්මනින් ම කට පාඩම් කර ගැනීමට හැකි විය. ස්වාක්ඛාතෝ භගවතෝ ධම්මෝ සන්දිට්ඨිකෝ යන්න කියන විට ම ආතා මතක් වන්නේ, ආතාගේ නම ටිකෝනිස් අප්පුහාමි නිසා ය.

සුමතිපාල මහතා ඇතුළු ගුරු මණ්ඩලයේ මග පෙන්වීම පිට දහම් පාසලේ ළමයින් සිල් ගැන්වීමට උනන්දු කළත් සිල් ගැනීමට ගියේ ටික දෙනෙකි. තම නිවසේ වැඩිහිටි අය සමඟ "ගිය පෝයට සිල් ගන්නට ගියේ කවුද"යි අසන ප්‍රශ්නයට හැමෝ ම අත් උස්සති. ඒත් ඒ බොහෝ අය සිල් ගන්න ගිය අය නො වූවත්, මා ආච්චිත් සමග සිල් ගන්නට ගිය කෙනෙකි.

මා මුලින් ම සිල් ගත්තේ දෙදහස් පන්සියය බුද්ධ ජයන්තියට ය. එක් දහස් නවසිය පනස් හය වසරේ බුද්ධ ජයන්ති මහෝත්සවය රට පුරා ම මහත් උත්සවශ්‍රීයෙන් පැවතිණි. (එම උත්සවය සැමරීම සඳහා රුපියලේ නිකල් කාසියක් සහ රිදී රුපියල් පහේ කාසියක් රජයෙන් නිකුත් කෙරිණි. ලංකාවේ පළමුවෙන් ම නිකුත් කරන ලද සමරු කාසි වූයේ මෙම කාසි දෙක ය. එම රුපියල් පහේ කාසිය ඉතාමත් අලංකාර ව සිත් බඳනා අයුරින් නිම කර තිබුණි. ලෝකයේ මිල පදක්කම් අතර සුවිශේෂ ස්ථානයක් මෙම රුපියල් පහට හිමිව ඇත. එම කාසියේ අනුරාධපුර සැකඩ පහණේ කැටයම මැද 2500 යනුවෙන් සටහන් කර තිබිණි. රුපියලේ කාසියේ එක් පසක ධර්ම චක්‍රය හා අනෙක් පස වෛත්‍යයක පින්තූරයක් ද ඊට යටින් 2500 වර්ෂය ද සටහන් ව තිබිණි.)

බුද්ධ ජයන්තියට අපේ ඉස්කෝලයේ ද ශීල ව්‍යාපාරයක් පැවැත්විණි. ගමේ ලොකු පොඩි බොහෝ දෙනෙක් එ දින පාසලේ සිල් ගත්හ. මට ද සිල් රෙද්දක් සහ සරමක් ආච්චි විසින් මසා දෙන ලදී. ආච්චි සමග සිල් ගන්නට යන මට සරම හසුරුවා ගැනීමට අපහසු ය. අපේ ගෙදර සිට පාසලට ඇති මීටර පහකින් පමණ දුර යන විට කීපවිටක් ම සරම ඇද හැලුණා මතක ය. සිල් දුන්නේ වරකාගොඩ පන්සලේ ලොකු හාමුදුරුවන් ය. ලොකු හාමුදුරුවෝ සිල් දී අවසන් වූ විගසම, රොබෝසිංඤෝ මාමාගේ බොක්ෂෝල් වර්ගයේ දැවැන්ත කාර් එකෙන් ආපසු පන්සලට වැඩියේ, එදා ඉතා විශේෂ දවසක් බැවින් බොහෝ වැඩ කටයුතු තිබුණු නිසා විය හැකි ය. සිල් දීමෙන් අනතුරුව උදේ උපාසක දානය පිළිගන්වන ලදී. දානයට නොයෙකුත් කෑම වර්ග තිබුණි. මා වැඩියෙන් ආසාවෙන් කෑවේ ආප්ප ය. ආප්ප හයක් වළඳා අවසානයේ හත්වන ආප්පයත් ගැනීමට අත යොමන විට ආච්චි "දැන් ඔය ඇතිධි" කියා ඒ ආප්පය ගැනීමට ඉඩ නොදී මගේ පෙරේතකමට පාඩමක් උගැන්වූවා ය. එම උත්සවය ගැන ඉන් එහාට කිසිවක් මතක නැත.

අපේ ආච්චි සිල් ගන්න යන විට ආච්චිගේ ළඟම උපාසිකා යෙහෙළිය පහළ ජේන් ආච්චි ය. එක වෙසක් පෝය දවසක උදේ ම ජේන් ආච්චි අපේ ගේ ළඟට පැමිණ ආච්චිට ද අඬ ගසා සිල් ගන්නට වරකාගොඩ විහාරස්ථානයට ගියේ, මාත්, මැණිකෙ පොඩිඅම්මාත් සමග ය. මානන

25 වන පිටට

කලාශූරී සනත් පියසේනයන් විසින් ලියන ලද'' පොඩි කොලුවයි ගමයි ගඟයි'' ග්‍රන්ථය ශ්‍රී ලංකා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කර ඇත.,මේ පොත තැපැල් මගින් ලබා ගැනීමට පහත ලිපිනයෙන් විමසන්න.
සනත් පියසේන
නො:33 ජරමන් හිත මිතු ගම මාකන්දන- -මඩපාත-ශ්‍රී ලංකාව
RES: 94-1-2702899
MO: 0776434146